# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,169—1960 ජූලි 29 වැනි සිකුරාදා—29.7.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් .. | 783 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 783 |
| වෙනත් පත් කිරීම් ... ... ... | 784 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 785 |
| මිල පාලන දැන්වීම් ... ... ... | 787 |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | — |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

**1960 අංක 312**

අංකය : ඩී. 31/රෙක්ට්/ඒ.

**ලංකා හමුදාව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

1954 ජූනි මස 1 වැනි දින සිට කපිතාන් වශයෙන් :—

ලෙප්ටිනන්ට් (තාවකාලික කපිතාන්) එම්. බී. ඒ. ක්ලාස්, සී.ඊ.

1958 ඔක්තෝබර් මස 1 වැනි දින සිට තාවකාලික මේජර් වරුන් වශයෙන් :—

කපිතාන් ඊ. සී. ජැන්සන්, සී.ඊ.

කපිතාන් එම්. බී. ඒ. ක්ලාස්, සී.ඊ.

කපිතාන් ඩී. ඩී. ගම්මම්පිල, සී.ඊ.

කපිතාන් කේ. රාජනාදන්, සී.ඊ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1960 ජූලි මස 22 දින,
කොළඹදීය.

---

**1960 අංක 313**

අංකය : ඩී. 1/රෙක්ට්/35.

**ලංකා හමුදාව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක් සහ ඇතුළත් කිරීමක්**

උසස් කිරීම

1959 ඔක්තෝබර් මස 15 වැනි දින සිට, ලෙප්ටිනන්ට් කෙනෙකු වශයෙන් :—

උප ලෙප්ටිනන්ට් ඒ. පී. ඒ. ද වී. ගුණවර්ධන.

ඇතුළත් කිරීම

1960 ජූනි මස 30 වැනි දින සිට, ලෙප්ටිනන්ට් ඒ. පී. ඒ. ද වී. ගුණවර්ධන ලංකා පාබල හමුදාවට ඇතුළත් කර ඇත.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1960 ජූලි මස 18 දින,
කොළඹදීය.

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1960 අංක 314**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේය :—

අංකය : ජේඑස්සී. පීපී. 4/60.

ඊ. බී. එස්. කොරෙයා මහතා නැති අතර, ඒ. ඊ. ආර්. කොරෙයා මහතා 1960 ජූනි 27 වැනි දින සිට 1960 අගෝස්තු 20 වැනි දින දක්වා, මාතර දිස්ත්‍රික් නඩුකාර ධුරයේ හා මාතර රික්වැස්ට් කොමසාරිස් ධුරයේ හා අතිරේක මහෙස්ත්‍රාත් ධුරයේ හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයේ වැඩ බැලීමට හා 1960 අගෝස්තු 21 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, මාතර දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා මාතර රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : සීජේපී/එස්. 24/59.

ටී. බී. ජී. ද අල්විස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. සෙල්ලයියා මහතා 1960 ජූලි 15 වැනි දින සිට 21 වැනි දින දක්වා, බලපිටියේ මහෙස්ත්‍රාත් ධුරයේ හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයේ හා බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයේ වැඩ බැලීමට.

අංකය : ජේඒ. 3/48.

අයි. එම්. ඉස්මයිල් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1960 ජූලි 19 වැනි දින සිට, අවිස්සාවේල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 40,501, 40,302, හා 40,303 නඩුවල තීන්දු දීමට හා අවිස්සාවේල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 42,108 නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට, අවිස්සාවේල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 3ඒ/59.

ඒ. එම්. අමීන් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. වී. එස්. ද සිල්වා මහතා 1960 ජූලි 15 වැනි හා 16 වැනි දිනයන්හි, කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා කුරුණෑගල, කතදුල්ලේ පිහිටි උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට (කුලියාපිටියේ නගර සභාවේ සීමාවතුල පිහිටි).

අංකය : ජේඑල්. 53ඒ/58.

කේ. ඒ. පී. රණසිංහ මහතා නැවත වැඩ බාරගන්නා තුරු, ටී. ආසිර්වාතම් මහතා 1960 අගෝස්තු 4 වැනි දින සිට, හා නැවතත් 1960 අගෝස්තු 11 වැනි දින සිට, හෝ නැවත නියමයක් කරන තුරු, රත්නපුරේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා රත්නපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 6ඒ/48.

බී. ජී. එස්. ඩේවිඩ් මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ජේ. ඩේවිඩ් මහතා 1960 ජූලි 25 වැනි දින සිට, මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා මඩකලපුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 63ඒ/58.

ජේ. ජී. එල්. සුවාරිස් මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. අමරසිංහ මහතා 1960 ජූලි 25 වැනි දින සිට, බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට (කතරගම පිහිටි උසාවියේ).

අංකය : ජේඑල්. 49ඒ/53.

එම්. පී. සී. රත්නම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1960 ජූලි 26 වැනි දින සිට 1960 අගෝස්තු 1 වැනි දින දක්වා, කොළඹ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට හා කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 23ඒ/58.

ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එම්. අයි. ගුණරත්න මහතා 1960 අගෝස්තු 5 වැනි දින සිට 8 වැනි දින දක්වා, මහනුවර, ගම්පොල පිහිටි උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 63ඒ/58.

ජේ. ජී. එල්. සුවාරිස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ටී. කේ. බුරා මහතා 1960 ජූලි 23 වැනි දින සිට 26 වැනි දින දක්වා, හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඑල්/පී. 1/48.

ආර්. පරමකුරු මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. එස්. පෝල් මහතා 1960 ජූලි 30 වැනි හා 31 වැනි දිනයන්හි, මන්නාරමේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා මන්නාරමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඑල්/එස්. 10/53.

එම්. සමරක්කොඩි මහතා නැති අතර, එල්. පණ්ඩිතරත්න මහතා 1960 ජූලි 16 වැනි දින, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ, සල්පිටි කෝරලේ හා කොළඹ ආදායම් පාලක නිලධාරිතැනගේ කොට්ඨාශයේ, ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච්. 3/18.

එන්. එස්. සිවප්‍රගාසම් මහතා 1960 අගෝස්තු 1 වැනි දින සිට 6 වැනි දින දක්වා, 8 වැනි දින සිට 12 වැනි දින දක්වා, 15 වැනි දින සිට 20 වැනි දින දක්වා, 22 වැනි දින සිට 27 වැනි දින දක්වා හා 29 වැනි දින සිට 31 වැනි දින දක්වා, හෝ නැවත නියමයක් කරන තුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ, ඒරාවූර් කෝරලේ, බින්තැන්න පත්තුවේ, හා උතුරු මාන්මුනේ පත්තුවේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

එස්. ආර්. විජේයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 ජූලි 22 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය. 573,
කොළඹ 12.

---

## වෙනත් පත් කිරීම

**1960 අංක 315**

අංකය : ඩී. 32/රෙක්ට්.

**රාජකීය ලංකා නාවුක හමුදාව—නිලධාරියෙක් ස්ථිර කිරීම**

1959 ජනවාරි මස 1 වැනි දින සිට, උප ලෙප්ටිනන්ට් (ඊ) කෙනෙකු වශයෙන් :—

වැඩ බලන උප ලෙප්ටිනන්ට් (ඊ) එච්. ජේ. එස්. බෝල්සිං, රාජකීය ලංකා නාවුක හමුදාව.

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්‍ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1960 ජූලි මස 16 දින,
කොළඹදීය.

---

**1960 අංක 316**

අංකය : ඩී. 10/රෙක්ට්.

**රාජකීය ලංකා නාවුක හමුදාව**

**නිලධාරියෙකුගේ පදවි නාමය වෙනස් කිරීම**

1960 පෙබරවාරි මස 1 වැනි දින සිට, පහත සඳහන් කරන ලද නිලධාරි තැන කොමිෂන් බලපත්‍ර ලත් පණිවුඩ හුවමාරු නිලධාරි වශයෙන් මාරුකිරීම අනුමතකොට තිබේ :—

කොමිෂන් බලපත්‍ර ලත් බෝසන් එච්. ඊ. මලර්, රාජකීය ලංකා නාවුක හමුදාව.

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්‍ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1960 ජූලි මස 15 දින,
කොළඹ දීය.

---

**1960 අංක 317**

අංකය : ජේ. 14/59.

1944 අංක 13 දරණ ආඥපනතින් සහ 1948 පෙබරවාරි මස 5 වෙනි දින අංක 9,828 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකරනලද 1948 පෙබරවාරි මස 4 වෙනි දින දරණ ප්‍රකාශනයෙන් සංශෝධිත 1939 අංක 48 දරණ ළමයින් සහ බාලවයස්කාරයින් පිළිබඳ ආඥපනතේ 3 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

1960 ජූනි මස 27 වෙනි දින සිට අවිස්සාවේල්ලේ මහෙස්ත්‍රාත් ධුරය දරණ කාලය තුල, අවිස්සාවේල්ලේ අධිකරණ කොට්ඨාශයට ඊ. සී. ටී. ලාබ්‍රෝයි මහතා ඔහුගේ අනිකුත් රාජකාරී වලට අතිරේක වශයෙන් ළමයින් පිළිබඳ මහෙස්ත්‍රාත්වරයා ලෙස පත්කර ඇත්තේ ය.

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
ස්ථිර ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

1960 ජූලි මස 19 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

# ආණ්ඩුවේ නිවේදන

## 1949 අංක 51 දරණ ගල්ඔය සංවර්ධන මණ්ඩලීය පනත

### නිවේදනයයි

1949 අංක 51 දරණ ගල්ඔය සංවර්ධන මණ්ඩලීය පනතෙහි 3 වැනි කොටස අනුව කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ගරු ඇමතිතුමා විසින් කොළඹ 6, හයිලෙවල් පාරේ අංක 298 දරණ නිවසෙහි, උණවටුන කපුගේ පියදාස සිල්වා මහතා ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ සාමාජිකයෙකු හැටියට ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට පත් කරනු ලැබ සිටින බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

සී. බී. පී. පෙරේරා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ
අමාත්‍යංශයේ නිත්‍ය ලේකම්.

කොළඹ 1.
1960. 7. 27.

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව

### අංක 73, තිස්සමහරාම මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් නියෝජිතයකු තෝරා පත් කිරීම සඳහා වූ මැතිවරණය

ඉහත කී මැතිවරණයේ මන්ත්‍රීධුරාපෙක්ෂකයකු වූ ආර්. ජී. ඩබ්ලිව්. නිලවීර මහතාගේ, මැතිවරණ වියදම් පිළිබඳ වූ වාර්තාව සහ එම වාර්තාවට සම්බන්ධ වූ ප්‍රකාශයන් ද, 1960, අප්‍රේල් මස 6 වන දින මා වෙත ලැබුණ බවත්, මෙම දැන්වීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ ද සිට ඉදිරියට ඇති හයමාසය තුලදී, රුපියල් එකක ගාස්තුවක් ගෙවීමෙන්, එකී වාර්තාව හා ප්‍රකාශයන් ද කාර්යශීල වේලාවන් තුළ ඕනෑම විටකදී හම්බන්තොට කච්චේරියේ දී පරීක්ෂා කළ හැකි බැව්, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ), රාජ සභා ආඥාවේ 71 (1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. සිවඥානම්,
තෝරීම් භාර නිලධාරී තැන.

අංක 73, තිස්සමහරාම මැතිවරණ කොට්ඨාශය.

හම්බන්තොට කච්චේරිය,
1960 ජූනි 11 වැනි දින.

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව

### අංක 73, තිස්සමහරාම මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් නියෝජිතයකු තෝරා පත් කිරීම සඳහා වූ මැතිවරණය

ඉහත කී මැතිවරණයේ මන්ත්‍රීධුරාපෙක්ෂකයකු වූ ඩැනිස්ටර් සේරසිංහ මහතාගේ මැතිවරණ වියදම් පිළිබඳ වූ වාර්තාව සහ එම වාර්තාවට සම්බන්ධ ප්‍රකාශයන් ද, 1960 අප්‍රේල් මස 14 දින මා වෙත ලැබුණ බවත්, මෙම දැන්වීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ ද සිට ඉදිරියට ඇති හයමාසය තුලදී, රුපියල් එකක ගාස්තුවක් ගෙවීමෙන්, එකී වාර්තාව හා ප්‍රකාශයන් ද කාර්යශීල වේලාවන් තුළ ඕනෑම විටකදී හම්බන්තොට කච්චේරියේ දී පරීක්ෂා කළ හැකි බැව්, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ 71 (1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. සිවඥානම්,
තෝරීම් භාර නිලධාරී තැන,

අංක 73, තිස්සමහරාම මැතිවරණ කොට්ඨාශය.

හම්බන්තොට කච්චේරිය,
1960 ජූනි 11 වැනි දින.

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව

### අංක 73, තිස්සමහරාම මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් නියෝජිතයකු තෝරා පත් කිරීම සඳහා වූ මැතිවරණය

ඉහත කී මැතිවරණයේ මන්ත්‍රීධුරාපෙක්ෂකයකු වූ සී. ඇෆ්ජ්. ඩබ්ලිව්. එදිරිසූරිය මහතාගේ මැතිවරණ වියදම් පිළිබඳ වූ වාර්තාව සහ එම වාර්තාවට සම්බන්ධ වූ ප්‍රකාශනයන් ද, 1960 අප්‍රේල් මස 18 දින මා වෙත ලැබුණ බවත්, මෙම දැන්වීම අණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ ද සිට ඉදිරියට ඇති හයමාසය තුලදී, රුපියල් එකක ගාස්තුවක් ගෙවීමෙන්, එකී වාර්තාව හා ප්‍රකාශයන් ද කාර්යශීල වේලාවන් තුළ ඕනෑම විටකදී හම්බන්තොට කච්චේරියේ දී පරීක්ෂා කළ හැකි බැව්, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ 71 (1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. සිවඥානම්,
තෝරීම් භාර නිලධාරී තැන.

අංක 73, තිස්සමහරාම මැතිවරණ කොට්ඨාශය.

හම්බන්තොට කච්චේරිය,
1960 ජූනි 11 වැනි දින.

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව

### අංක 73, තිස්සමහරාම මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් නියෝජිතයකු තෝරා පත් කිරීම සඳහා වූ මැතිවරණය

ඉහත කී මැතිවරණයේ මන්ත්‍රීධුරාපෙක්ෂකයකු වූ ලක්ෂමන් රාජපක්ෂ මහතාගේ මැතිවරණ වියදම් පිළිබඳ වූ වාර්තාව සහ එම වාර්තාවට සම්බන්ධ වූ ප්‍රකාශයන් ද, 1960 අප්‍රේල් මස 19 දින මා වෙත ලැබුණ බවත්, මෙම දැන්වීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ ද සිට ඉදිරියට ඇති හයමාසය තුලදී, රුපියල් එකක ගාස්තුවක් ගෙවීමෙන්, එකී වාර්තාව හා ප්‍රකාශයන් ද කාර්යශීල වේලාවන් තුළ ඕනෑම විටක දී හම්බන්තොට කච්චේරියේ දී පරීක්ෂා කළ හැකි බැව්, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ 71 (1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. සිවඥානම්,
තෝරීම් භාර නිලධාරී තැන.

අංක 73, තිස්සමහරාම මැතිවරණ කොට්ඨාශය.

හම්බන්තොට කච්චේරිය,
1960 ජූනි 11 වැනි දින.

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව

### අංක 73, තිස්සමහරාම මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් නියෝජිතයකු තෝරා පත් කිරීම සඳහා වූ මැතිවරණය

ඉහත කී මැතිවරණයේ මන්ත්‍රීධුරාපෙක්ෂකයකු වූ ඒ. ඊ. වික්‍රමසූරිය මහතා ගේ මැතිවරණ වියදම් පිළිබඳ වූ වාර්තාව සහ එම වාර්තාවට සම්බන්ධ වූ ප්‍රකාශයන් ද, 1960 අප්‍රේල් මස 23 වැනි දින මා වෙත ලැබුණ බවත්, මෙම දැන්වීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ ද සිට ඉදිරියට ඇති හයමාසය තුලදී, රුපියල් එකක ගාස්තුවක් ගෙවීමෙන්, එකී වාර්තාව හා ප්‍රකාශයන් ද කාර්යශීල වේලාවන් තුළ ඕනෑම විටකදී හම්බන්තොට කච්චේරියේ දී පරීක්ෂා කළ හැකි බැව්, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ 71 (1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. සිවඥානම්,
තෝරීම් භාර නිලධාරී තැන.

අංක 73, තිස්සමහරාම මැතිවරණ කොට්ඨාශය.

හම්බන්තොට කච්චේරිය,
1960 ජූනි 11 වැනි දින.

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව

### අංක 73, තිස්සමහරාම මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් නියෝජිතයකු තෝරා පත් කිරීම සඳහා වූ මැතිවරණය

ඉහත කී මැතිවරණයේ මන්ත්‍රීධුරාපෙක්ෂකයකු වූ ඊ. ජී. විජේසිංහ මහතාගේ මැතිවරණ වියදම් පිළිබඳ වූ වාර්තාව සහ එම වාර්තාවට සම්බන්ධ වූ ප්‍රකාශයන් ද, 1960 අප්‍රේල් මස 25 දින මා වෙත ලැබුණ බවත්, මෙම දැන්වීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ ද සිට ඉදිරියට ඇති හයමාසය තුලදී, රුපියල් එකක ගාස්තුවක් ගෙවීමෙන්, එකී වාර්තාව හා ප්‍රකාශයන් ද කාර්යශීල වේලාවන් තුළ ඕනෑම විටකදී හම්බන්තොට කච්චේරියේ දී පරීක්ෂා කළ හැකි බැව්, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ 71(1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. සිවඥානම්,
තෝරීම් භාර නිලධාරී තැන.

අංක 73, තිස්සමහරාම මැතිවරණ කොට්ඨාශය.

හම්බන්තොට කච්චේරිය,
1960 ජූනි මස 11 වැනි දින.

**1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව**
**අංක 71, බෙලිඅත්ත මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් නියෝජිතයකු තෝරා පත් කිරීම සඳහා වූ මැතිවරණය**

ඉහත කී මැතිවරණයේ මන්ත්‍රීධූරාපෙක්ෂකයකු වූ කේ. වික්‍රම නායක මහතාගේ, මැතිවරණ වියදම් පිළිබඳ වූ වාර්තාව සහ එම වාර්තාවට සම්බන්ධ වූ ප්‍රකාශයන් ද, 1960 අප්‍රේල් මස 23 දින මා වෙත ලැබුණ බවත්, මෙම දැන්වීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ දා සිට ඉදිරියට ඇති හයමාසය තුළදී, රුපියල් එකක ගාස්තුවක් ගෙවීමෙන්, එකී වාර්තාව හා ප්‍රකාශයන් ද කාර්යාල වේලාවන් තුළ ඕනෑම විටකදී හම්බන්තොට කච්චේරියේ දී පරීක්‍ෂා කළ හැකි බැව් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 71 (1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. සිවඥානම්,
තේරීම් භාර නිලධාරි තැන.
අංක 71, බෙලිඅත්ත මැතිවරණ කොට්ඨාශය.

හම්බන්තොට කච්චේරිය,
1960 ජූනි මස 11 වැනි දින.

---

**1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව**
**අංක 71, බෙලිඅත්ත මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් නියෝජිතයකු තෝරා පත් කිරීම සඳහා වූ මැතිවරණය**

ඉහත කී මැතිවරණයේ මන්ත්‍රීධූරාපෙක්ෂකයකු වූ ඩී. ඇල්. වීර රත්න මහතාගේ, මැතිවරණ වියදම් පිළිබඳ වූ වාර්තාව සහ එම වාර්තාවට සම්බන්ධ වූ ප්‍රකාශයන් ද, 1960 අප්‍රේල් මස 19 දින මා වෙත ලැබුණ බවත්, මෙම දැන්වීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ දා සිට ඉදිරියට ඇති හයමාසය තුළදී, රුපියල් එකක ගාස්තුවක් ගෙවීමෙන්, එකී වාර්තාව හා ප්‍රකාශයන් ද කාර්යාල වේලාවන් තුළ ඕනෑම විටකදී හම්බන්තොට කච්චේරියේ දී පරීක්‍ෂා කළ හැකි බැව්, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ 71 (1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. සිවඥානම්,
තේරීම් භාර නිලධාරි තැන.
අංක 71, බෙලිඅත්ත මැතිවරණ කොට්ඨාශය.

හම්බන්තොට කච්චේරිය,
1960 ජූනි මස 11 වැනි දින.

---

**1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව**
**අංක 71, බෙලිඅත්ත මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් නියෝජිතයකු තෝරා පත් කිරීම සඳහා වූ මැතිවරණය**

ඉහත කී මැතිවරණයේ මන්ත්‍රීධූරාපෙක්ෂකයකු වූ ඩී. පී. අතපත්තු මහතාගේ මැතිවරණ වියදම් පිළිබඳ වූ වාර්තාව සහ එම වාර්තාවට සම්බන්ධ වූ ප්‍රකාශයන් ද, 1960 අප්‍රේල් මස 23 දින මා වෙත ලැබුණ බවත්, මෙම දැන්වීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ දා සිට ඉදිරියට ඇති හය මාසය තුළදී, රුපියල් එකක ගාස්තුවක් ගෙවීමෙන්, එකී වාර්තාව හා ප්‍රකාශයන් ද කාර්යාල වේලාවන් තුළ ඕනෑම විටකදී හම්බන්තොට කච්චේරියේ දී පරීක්‍ෂා කළ හැකි බැව්, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ 71 (1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. සිවඥානම්,
තේරීම් භාර නිලධාරි තැන.
අංක 71, බෙලිඅත්ත මැතිවරණ කොට්ඨාශය.

හම්බන්තොට කච්චේරිය,
1960 ජූනි මස 11 වැනි දින.

---

**1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව**
**අංක 71, බෙලිඅත්ත මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් නියෝජිතයකු තෝරා පත් කිරීම සඳහා වූ මැතිවරණය**

ඉහත කී මැතිවරණයේ මන්ත්‍රීධූරාපෙක්ෂකයකු වූ පී. එච්. සෝමදාස මහතාගේ මැතිවරණ වියදම් පිළිබඳ වූ වාර්තාව සහ එම වාර්තාවට සම්බන්ධ වූ ප්‍රකාශයන් ද, 1960 අප්‍රේල් මස 23 දින මා වෙත ලැබුණ බවත්, මෙම දැන්වීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ දා සිට ඉදිරියට ඇති හය මාසය තුළදී, රුපියල් එකක ගාස්තුවක් ගෙවීමෙන්, එකී වාර්තාව හා ප්‍රකාශයන් ද කාර්යාල වේලාවන් තුළ ඕනෑම විටකදී හම්බන්තොට කච්චේරියේ දී පරීක්‍ෂා කළ හැකි බැව්, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ 71 (1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. සිවඥානම්,
තේරීම් භාර නිලධාරි තැන.
අංක 71, බෙලිඅත්ත මැතිවරණ කොට්ඨාශය.

හම්බන්තොට කච්චේරිය,
1960 ජූනි මස 11 වැනි දින.

---

**1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව**
**අංක : 71, බෙලිඅත්ත මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් නියෝජිතයකු තෝරා පත් කිරීම සඳහා වූ මැතිවරණය**

ඉහත කී මැතිවරණයේ මන්ත්‍රීධූරාකෝෂකයකු වූ ජී. ඩබ්ලිව්. සුමතිපාල මහතාගේ, මැතිවරණ වියදම් පිළිබඳ වූ වාර්තාව සහ එම වාර්තාවට සම්බන්ධ වූ ප්‍රකාශයන් ද, 1960 අප්‍රේල් මස 25 දින මා වෙත ලැබුණ බවත්, මෙම දැන්වීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ දා සිට ඉදිරියට ඇති හයමාසය තුලදී, රුපියල් එකක ගාස්තුවක් ගෙවීමෙන්, එකී වාර්තාව හා ප්‍රකාශයන් ද කාර්යාල වේලාවන් තුළ ඕනෑම විටකදී හම්බන්තොට කච්චේරියේ දී පරීක්‍ෂා කළ හැකි බැව්, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ 71 (1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. සිවඥානම්,
තේරීම් භාර නිලධාරි තැන.
අංක 71, බෙලිඅත්ත මැතිවරණ කොට්ඨාශය.

හම්බන්තොට කච්චේරිය,
1960 ජූනි මස 11 වැනි දින.

---

**1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව**
**අංක : 71 බෙලිඅත්ත මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් නියෝජිතයකු තෝරා පත් කිරීම සඳහා වූ මැතිවරණය**

ඉහත කී මැතිවරණයේ මන්ත්‍රීධූරාපෙක්ෂකයකු වූ ඩබ්ලිව්. මතගවීර මහතා ගේ, මැතිවරණ වියදම් පිළිබඳ වූ වාර්තාව සහ එම වාර්තාවට සම්බන්ධ වූ ප්‍රකාශයන් ද, 1960 අප්‍රේල් මස 25 වැනි දින මා වෙත ලැබුණ බවත්, මෙම දැන්වීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ දා සිට ඉදිරියට ඇති හයමාසය තුලදී, රුපියල් එකක ගාස්තුවක් ගෙවීමෙන්, එකී වාර්තාව හා ප්‍රකාශයන් ද කාර්යාල වේලාවන් තුළ ඕනෑම විටකදී හම්බන්තොට කච්චේරියේ දී පරීක්ෂා කළ හැකි බැව් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ 71 (1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. සිවඥානම්,
තේරීම් භාර නිලධාරි තැන.
අංක 71, බෙලිඅත්ත මැතිවරණ කොට්ඨාශය.

හම්බන්තොට කච්චේරිය,
1960 ජූනි මස 11 වැනි දින.

---

# මිළ පාලන දැන්වීම්

**1960 අංක ඇම්ඇක්/6 දරන ආහාර මිළ නියෝගය**

**එළුමස් සහ හරක්මස්**

## 1950 අංක 29 දරන මිළ පාලන පනත

**නියෝගය**

මන්නාරම් දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක තැන්පත් දොන් ජෝන් ප්‍රැන්සිස් ඩග්ලස් ලියනගේ වන මම, 1950ගේ අංක 29 දරන මිළ පාලන පනතේ 3 (2) දරන වගන්තිය සමඟ කියවිය යුතු 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) මීට යාකර ඇති උපලේඛනයේ 2 සිට 5 දක්වා ඇති තීරවල සඳහන් මිළ එළුමස් හෝ මෙරට හරක්මස් රාත්තලක් 1960 අගෝස්තු මස 5 වෙනි දින සිට විකිණිය හැකි වැඩිම මිළ වශයෙන් මෙම නියෝගයෙන් නියම කරමි. එම තීරයන්හි මුදුනේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස් හෝ මෙරට හරක්මස් එම උපලේඛනයේම 1 වැනි තීරයේ සඳහන් කොට ඇති ප්‍රදේශය තුළ එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතු බවද මෙම නියෝගයෙන් නියම කරමි.

(2) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) "එළුමස්" යනුවෙන් හැඟවෙන්නේ බැටළුවෙකුගේ හෝ එළුවෙකුගේ මාංශයයි. බොකු, බඩවැල් ආදී සියලු ආකාර ඉවත් කරනු ලබන දැය මීට ඇතුළත් නොවේ.

(ආ) "මෙරට හරක්මස්" යනුවෙන් හැඟවෙන්නේ ඇති කරන ඉන්දියානු හෝ ප්‍රදේශික ගවයන්ගේ හෝ මීහරකුන්ගේ මාංශයයි. බොකු, බඩවැල් ආදී සියලු ආකාර ඉවත් කරනු ලබන දැය මීට ඇතුළත් නොවේ.

(3) කටු සහිත එළුමස් හෝ මෙරට හරක්මස් විකුණන කල්හි විකුණන මුළු බරින් සියයට විසි පහකට වඩා කටුවල බර වැඩි නොවිය යුතුයි.

(4) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කොට ඇති සෑම ප්‍රදේශයකම කිසියම් තැනක හෝ වාහනයක තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ උපලේඛනයේ සඳහන් වර්ගවලට සහ

ශ්‍රෙණිවලට අයත් එළුමස් හෝ මෙරට හරක්මස් ඇති සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා උපලේඛනයේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස් හෝ මෙරට හරක්මස් සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන ලෙස තැබිය යුතුයි.

(5) ඉවත් කරනු ලබන දිය සමඟ එළුමස් හෝ මෙරට හරක්මස් එකම ගනුදෙනුවකදී විකුණනු ලබන විට එළුමස් හෝ මෙරට හරක්මස් ඉවත් කරනු ලබන දියින් වෙන් වශයෙන් කිරා විකිණිය යුතුයි.

(6) සෑම වෙළෙන්දෙකුම එළුමස් හෝ මෙරට හරක්මස් විකුණන කල්හි එළුමස් හෝ මෙරට හරක්මස් ලබාගන්නාට සැබෑ බර පහසුවෙන් බලා ගැනීමට හැකිවන සේ බර කිරන තරාදිය හෝ තරාදි තැබිය යුතුයි.

(7) මීට යාකර ඇති උපලේඛනයේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස් හෝ මෙරට හරක්මස් විකුණන සෑම වෙළෙන්දෙකුම එළුමස් හෝ මෙරට හරක්මස් ලබාගන්නකු ඉල්ලා සිටිය විට කුවිතාන්සියක් දිය යුතුයි. එම කුවිතාන්සියේ—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ එළුමස් හෝ මෙරට හරක්මස් ප්‍රමාණය (බර) ;

(ඇ) විකුණූ එළුමස් හෝ මෙරට හරක්මස් වල විස්තරය සහ

(ඈ) විකුණූ මස් ප්‍රමාණයට ගෙවූ මුදලද,

සඳහන් විය යුතුයි.

(8) මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරන ලද සෑම ප්‍රදේශයක් තුළ කිසිවකු උපලේඛනයේ සඳහන් දිය වෙන කිසියම් මසක් හෝ මාංශයක් සමඟ කලවම් කොට නොවිකිණිය යුතුයි.

(9) උපලේඛනයේ සඳහන් දිය විකුණන කල්හි, එකී දිය ඔතා හෝ බහා දෙන කිසියම් ද්‍රව්‍යයක මිළක් වෙතොත් එය එම උපලේඛනයේ 2 සිට 5 වැනි තීරයන්හි සඳහන් වැඩිම මිළෙහි අන්තර්ගත වේ.

(10) මෙම නියෝගයේ කාර්ය සඳහා "රාත්තල" හෙවත් "රා" යන්නෙන් හැඟවෙන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

වර්ෂ 1960 ජූලි මස 23 වෙනි දින 11.30ට මන්නාරමේදී අත්සන් කරන ලදී.

ඩී. ජේ. ඈෆ්. ඩී. ලියනගෙ,
මන්නාරම් දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර)
මිළ පාලක තැන.

උපලේඛනය

**එළු මස් සහ මෙරට හරක් මස් විකිණිය හැකි වැඩිම මිළ**

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය | 4 වැනි තීරය | 5 වැනි තීරය |
|---|---|---|---|---|
| ප්‍රදේශය | එළුමස් (කටු රහිත) රාත්තලක වැඩිම මිළ | එළුමස් (කටු සහිත) රාත්තලක වැඩිම මිළ | මෙරට හරක්මස් (කටු රහිත) රාත්තලක වැඩිම මිළ | මෙරට හරක් මස් (කටු සහිත) රාත්තලක වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| පාලම්පිටි සහ පුලියඩිඉරක්කම් යන ගම්මුලාදෑනි කොට්ඨාශවල ... ... | 2 75 | 2 25 | 0 85 | 0 75 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මෙවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයයේ මුද්‍රණය කරන ලදී.